GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

18-04-2013

මාධ්‍ය නිවේදනය

වෛද්‍යවරුන් රෝගී ප්‍රතිකාර වලදී රෝගීන් සමග මිත්‍රශීලිභාවය වැඩි දියුණුකර ගැනීම සඳහා ආරම්භ කරන ලද වැඩ පිළිවෙල මුල් අදියර සාර්ථකව සිදුවිය.

සියළුම පූර්ව සිමාවාසික වෛද්‍යවරුන්ට දින 10ක නේවාසික පුහුණුවක් මගින් දෙමළ භාෂාව කතා කිරීමේ හැකියාව ඇති කරන වැඩ පිළිවෙල අප්‍රේල් 02 වන දා ආරම්භවූ අතර එහි පළමු වෛද්‍යවරු 35 දෙනා පුහුණුව සාර්ථක අයුරින් නිම කරන ලදී. අප්‍රේල් 20 වන දින තවත් වෛද්‍යවරු 65 දෙනෙක් මෙම පුහුණුව ආරම්භ කරනු ඇත. මේ අනුව අප්‍රේල් අවසන් වන විට 100 දෙනෙක් රෝගීන් සමග හොඳින් දෙමළ භාෂාව කතා කිරීම ආරම්භ කරනු ඇත. මේ වසර අග වන විට අවම වශයෙන් වෛද්‍යවරු 1000කට පමණ රෝගීන් සමග හොඳින් දෙමළ භාෂාවෙන් කතා කිරීමේ හැකියාව ලැබෙනු ඇත.

එමෙන්ම වෛද්‍යවරුන්ගේ සංනිවේදන කුසලතා දියුණු කිරීමේ වැඩ සටහන සඳහා පුහුණු කරන වෛද්‍යවරුන් බිහි කිරීමේ වැඩ සටහන අප්‍රේල් 06 වන දා ආරම්භ වූ අතර පුහුණු කරුවන් ලෙස වෛද්‍යවරු 17 දෙනෙක් එහිදී ප්‍රවීණත්වය ලැබිය. රෝගීන්ට ඇහුම්කන් දීම, රෝගීන්ගේ ප්‍රශ්න සහ හැගීම් කාර්යක්ෂමව තේරුම් ගැනීම, යහපත් සෞඛ්‍ය රටා සඳහා රෝගීන් දිරි ගැන්වීම ශෝක ජනක ප්‍රවෘත්ති රෝගියාට සංනිවේදනය කරන ආකාරය යන කරුනු පිළිබඳව ඉහල පුහුණුවක් මෙම වෛද්‍යවරු 17 දෙනා ලැබිය.

ඉදිරියේදී මෙම වෛද්‍යවරු 17 දෙනා අනෙකුත් වෛද්‍යවරු පුහුණු කිරීම සඳහා අවශ්‍ය කරන ප්‍රවීනතාවය ලැබූ බවට සහතික පත්‍ර ලබා දෙන ලදී. ලෝක සෞඛ්‍ය සංවිධානයේත්, රාජ්‍ය භාෂා දෙපාර්තමේනතුවෙත්, සෞඛ්‍ය අමාත්‍යාංශයෙත් අනුග්‍රහයෙන් මෙම කටයුතු සිදු වන බව අප පෙන්වා දෙන අතර රෝගීන්ට ආදාල වඩා මිත්‍රශීලි සෞඛ්‍ය සේවාවක් ලබාදීමට අප ගෙන යන මෙම වැඩපිළිවෙල ඉවහල් වනු ඇත.

ස්තුතියි

වෛද්‍ය චන්දික එපිටකඩුව
ලේකම්

වෛද්‍ය නවීන් ද සොයිසා : 0718582444
වෛද්‍ය නලින්ද හේරත් : 0717876516